www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: සසජාශි-සසප කාර්ල් මාක්ස් සහ චාර්ල්ස් ඩාවින් පිලිබඳ රැස්වීමක් කොලඹ දී පවත්වයි.

**Sri Lanka: ISSE-SEP meeting in Colombo on Karl Marx and Charles Darwin**

**2009 අගෝස්තු 04**

ශ්‍රී ලංකාවේ සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සහ සමාජවාදී සමානතා පක්ෂය (සසප) 19 වන සියවසේ ශ්‍රේෂ්ඨතම විප්ලවවාදී චින්තකයින් දෙදෙනෙකු වූ කාර්ල් මාක්ස් සහ චාර්ල්ස් ඩාවින් විසින් කරන ලද ප්‍රතිපදානය ගැන ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ලබයි. මෙම වසර ඩාවින්ගේ උපතින් පසු 200වන වසර සහ ඔහුගේ *On the Origins of Species* ඔන් ද ඔරිජින් ඔෆ් ස්පේසීස් ප්‍රකාශයට පත් කිරීමෙන් 150 වන වසර සනිටුහන් කරයි.

ෆෙඩ්රික් එංගල්ස් 1859 දී මාක්ස්ට මෙසේ ලිවීය: "කොහොම නමුත් මා දැන් කියවමින් සිටින ඩාවින කදිමයි.... ස්වභාවධර්මයේ ඓතිහාසික පරිනාමය විදහා දැක්වීම සඳහා මේ සා පරිමාන ප්‍රයත්නයක් මෙයට පෙර දරා නැත. නිශ්චිතවම එවන් යහපත් ක්‍රියාවක් සිදු වී නැත." ඩාවින්ගේ න්‍යායෙහි වැදගත්කම තේරුම් ගනිමින් 1861 දී මාක්ස් මෙසේ ලිවීය. "ඩාවින්ගේ කෘතිය අතිශයින්ම වැදගත් හා ඓතිහාසික පන්ති අරගලය සඳහා ස්වාභාවික විද්‍යාවේ දී පදනමක් සම්පාදනය කරන හෙයින් එය මගේ අරමුනට ගැලපෙයි."

විද්‍යාව පිලිබඳ ශ්‍රේෂ්ඨතම චින්තකයන් දෙදෙනා - මාක්ස් සහ ඩාවින් - නූතන යුගය තරනය කලහ. අද ඔවුන් දෙදෙනාගේ කර්තව්‍යයන් සම්පූර්න ඇගවුම් ඉස්මතු වීම පටන් ගත්තා පමනි. ඩීඑන්ඒ සොයාගැනීමත් සමග පරිනාමය එහි විභවය පරිපූර්නත්වයට පත් කර ගත් අතර ආගමික මූලධර්මවාදීන් ගේ විරුද්ධත්වය තිබියදී ම එය අපගේ දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ.

සමාජවාදයේ විරුද්ධවාදීන් විසින් යල්පැන ඇති බව දිගු කලක සිට මාක්ස්ව ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති නමුදු ලෝක මූල්‍ය පද්ධතිය පුපුරා යන සහ ලෝක ආර්ථිකය අසාමාන්‍ය අවපාතයකට ඇද වැටෙන තතු යටතේ ඔහුගේ කර්තව්‍යය නව අදාලත්වයක් අත් කර ගෙන තිබේ. සසජාශි සහ සසප රැස්වීම ඔවුන්ගේ වැඩ කටයුතුවලට උත්තේජනය ලබා දුන් පොදු තේමාවන් එලි පෙහෙලි කරමින් සහ වර්තමානය සඳහා ඔවුන්ගේ අර්ථභාරය ගවේශනය කරමින් මෙම බලගතු චින්තකයන් දෙදෙනාගේ අදහස් පරීක්ෂා කරනු ඇත. රැස්වීමට සහභාගිවෙමින් සාකච්ඡාවට සම්බන්ධ වන ලෙස සියලු ම ශිෂ්‍යයන්, තරුනයන්, බුද්ධිමතුන් සහ ලෝක සමාජවාදී වෙබ් අඩවි පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු.

**කථිකයා:** පානිනී විජේසිරිවර්ධන

**වේලාව සහ දිනය:** 04 වන අඟහරුවාදා සවස 3.30ට

**ස්ථානය:** කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාර ප්‍රවේශාගාරය.

© www.wsws.org